# පැරණි ගිහි විනය සංග්‍රහ පිළිබඳ අධ්‍යයනයක්

## (උපාසකජනාලංකාරය හා මිදෙල්ලවල සෝණුත්තර සාමණේර නමගේ පුරාණ ගිහි විනය සංග්‍රහය ඇසුරින්)

ආලෝකා රශ්මි ලියනගේ[1]


දීඝනිකායේ සිගාලක සූත්‍රය ගිහි විනය අන්තර්ගත බුද්ධ දේශිත සූත්‍රයක් වශයෙන් සම්භාවනාවට පාත්‍ර වී ඇත. මෙම සූත්‍රයෙහි ගිහියා විසින් අනුගමනය නොකළ යුතු සදාචාර විරෝධී ක්‍රියා පිළිබඳ ව හා යුතුකම් ආදිය පිළිබඳ දීර්ඝ විස්තරයක් සඳහන් වෙයි. දැනට පිළිගත හැකි පැරණිතම ගිහි විනය සංග්‍රහය වශයෙන් මෙම සූත්‍රය හැඳින්විය හැකිය. මෙම සූත්‍ර දේශනාවෙන් ලැබුණු ආභාසයක් කරණ කොට ගෙන හෝ බුද්ධ කාලයෙන් පසුව ද නොයෙක් ගිහි විනය සංග්‍රහ පශ්චාත් කාලීන විද්වතුන් විසින් සම්පාදනය කොට ඇත. උපාසකජනාලංකාරය හා මිදෙල්ලවල සෝණුත්තර සාමණේර නමගේ පුරාණ ගිහි විනය සංග්‍රහය මීට උදාහරණ වන අතර අප විසින් පර්යේෂණයෙහි පහසුව තකා මෙහිලා අධ්‍යයනය කරනුයේ ද එම ග්‍රන්ථ දෙක පමණි.

උපාසකජනාලංකාරය පාලි හා සිංහල වශයෙන් පොත් දෙකක් දැක ගත හැකි අතර පාලි කෘතිය දඹදෙණි යුගයේදී රචනා වූවකි. එය දඹදෙණි සමයේ මුල් කාල සීමාවට අයත් තුන්වැනි විජයබා රජු දවස පෙරම්පල්ලි විහාරයෙහි වැඩ විසූ සිංහලාචාර්ය නම් හිමි නමක විසින් සම්පාදිතය. දැනට දක්නට ලැබෙන සිංහල උපාසකජනාලංකාරය එම පාලි කෘතිය ඇසුරින් මහනුවර යුගයේදී මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් විසින් සම්පාදනය කරන ලද්දකි. මෙම සිංහල උපාසකජනාලංකාරයෙහි ගිහි විනය අතිශය ගැඹුරින් දක්වා ඇත. සිගාලක සූත්‍රයෙහි සඳහන් ගිහි විනය ලෞකික අංශයට වැඩි යොමුවක් තිබුණ ද උපාසකජනාලංකාර කතුවරයා ලෝකෝත්තර අංශය පිළිබඳ ව ද වැඩි අවධානයක් යොමු කොට තිබේ. මේ අනුව එතුමා පැවිද්දන් විසින් වුව දුෂ්කර සේ රැකිය හැකි ධුතංග වැනි ඉගැන්වීමවල ද ගිහියනට අදාළ අංශ පිළිබඳව අවධානය යොමු කරමින් ලොකෝත්තර සම්පත්තිය දක්වාම කරුණු ගෙන හැර දක්වනුයේ සරණ නිද්දෙසය, සීල නිද්දෙසය, ධුතංග නිද්දෙසය හා ආජීව නිද්දෙසය යනාදි නිද්දෙස ක්‍රමයෙනි. කතුවරයා විසුද්ධිමාර්ගාගත ක්‍රමයට මෙම ග්‍රන්ථය සම්පාදනය කරනුයේ ඒ ඇසුරින් ගිහියන්ට අදාළ කරගත හැකි ක්‍රමයක් පෙන්වන්නාක් මෙනි.

මෙහිදී අවධානය යොමු කෙරෙන දෙවැනි ගිහි විනය සංග්‍රහය වන මිදෙල්ලවල සාමණේර නමගේ සංග්‍රහය කවර කලෙක රචනා වූවක්දැයි කරුණු සොයා ගත නොහැකිය. මෙහි අන්තර්ගත වන කරුණුවලට අනුව සාමාන්‍ය ගිහි බෞද්ධයන් විසින් දැන ගත යුතු කරුණු පිළිබඳ දැනුවත් කිරීමට රචනා කොට ඇති බව පැහැදිලිය. ඒ අනුව මෙහි බෝසත් විවරණ, තිසරණය, පස්පව්, දස අකුසල්, කර්ම විපාක හා සප්ත විසුද්ධි යනාදිය විස්තර කොට තිබේ. කෙසේ වෙතත් මෙම කෘති දෙකම අධ්‍යයනයෙන් පැහැදිලි වනුයේ අවශ්‍යතා දෙකක් පිරිමසනු වස් රචනා කරන ලද කෘති දෙකක් බවයි. එනම් උපාසකජනාලංකාර කතුවරයාට අවශ්‍ය වූයේ ගිහියන්ට අදාළ ගැඹුරු පිළිවෙතක් නිර්දේශ කිරීම වන අතර මිදෙල්ලවල හිමියනට අවශ්‍ය වූයේ බුදුදහම පිළිබඳව වැඩි දැනුමක් නැති සාමාන්‍ය ජනයා දැනුවත් කිරීම බවයි.


**ප්‍රමුඛ පදඃ** ගිහි විනය, උපාසකජනාලංකාරය, සංග්‍රහය, සිගාලක සූත්‍රය, අවශ්‍යතා

---

1 Undergraduate Student (2nd Year), Dept. of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura
Email : alokaras90@gmail.com